*සියලු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / Grade: 12 | විෂයය / Subject: **ව්‍යාපාර අධ්‍යයනය** | කාලය / Time: පැය 02 |

## I පත්‍රය

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ගංවතුරෙන් විපතට පත් වූවන්ට පිහිට වීමේදී, ඔවුන්ගේ මූලික "අවශ්‍යතා (Needs) සහ වුවමනා (Wants)" හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙම තත්ත්වය තුළ, පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් අවශ්‍යතා (Needs) පිළිබඳව පමණක් නිවැරදිව විස්තර කරන්නේ කුමන ප්‍රකාශයද ?

    1. ජීවත්වීමට අත්‍යාවශ්‍යයෙන්ම සපුරාගත යුතු අතර, ව්‍යාපාරිකයෙකුට පහසුවෙන් නිර්මාණය කළ හැකිය.
    2. සීමිත වන අතර, සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැක.
    3. සියලු දෙනාටම පොදු වන අතර, ජීවත්වීමට අත්‍යාවශ්‍යයෙන්ම සපුරාගත යුතු නොවේ.
    4. පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වන අතර, අසීමිත වේ.
    5. සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි අතර, ජීවත්වීමට අත්‍යාවශ්‍යයෙන්ම සපුරාගත යුතු වේ.

02. 'ලිසාරා ට්‍රැවල්ස්' යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංචාරක නියෝජිත ආයතනයකි. ඔවුන් දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා අද්විතීය සංචාරක පැකේජ සපයයි. මෙම පැකේජවලට නවාතැන්, ප්‍රවාහනය, මාර්ගෝපදේශ සේවා සහ විවිධ සංචාරක ආකර්ෂණ ස්ථාන නැරඹීමට අවස්ථා ඇතුළත් වේ. මීට අමතරව "ලිසාරා ට්‍රැවල්ස්" සිය පාරිභෝගිකයන්ට අන්තර්ජාලය හරහා ගුවන් ටිකට්පත් වෙන්කරවා ගැනීමේ පහසුකම් ද සලසා දෙයි.
    "ලිසාරා ට්‍රැවල්ස්" විසින් සපයනු ලබන සේවා (Services) සහ භාණ්ඩ (Goods) නිවැරදිව වර්ගීකරණය කරන ආකාරය වන්නේ,

    1. සේවා ඃ සංචාරක පැකේජ, භාණ්ඩ ඃ ගුවන් ටිකට්පත්
    2. සේවා ඃ නවාතැන්, ප්‍රවාහනය, මාර්ගෝපදේශ සේවා, භාණ්ඩ ඃ සංචාරක පැකේජ
    3. සේවා ඃ සංචාරක පැකේජ, ගුවන් ටිකට්පත් වෙන්කරවා ගැනීම ; භාණ්ඩ ඃ කිසිවක් නැත.
    4. සේවා ඃ නවාතැන්, ප්‍රවාහනය, මාර්ගෝපදේශ සේවා, ගුවන් ටිකට්පත් වෙන්කරවා ගැනීම; භාණ්ඩ ඃ කිසිවක් නැත.
    5. සේවා ඃ සංචාරක පැකේජ, මාර්ගෝපදේශ සේවා; භාණ්ඩ ඃ නවාතැන්, ප්‍රවාහනය, ගුවන් ටිකට්පත්

03. රසිඳු සිය නිවසේ පිහිටි කුඩා ඉඩමක කාබනික එළවළු වගාවක් ආරම්භ කළේය. ඔහු අස්වනු නෙළා ගත් පසු, අතිරික්ත එළවළු තම අසල්වැසියන්ට සහ මිතුරන්ට නොමිලේ බෙදා දුන්නේය. පසුව, ඔහු තම නිෂ්පාදන වැඩි දියුණු කර, අසල ඇති සුපිරි වෙළඳසැලකට සහ දේශීය වෙළඳපොළකට නිතිපතා විකිණීමට පටන් ගත්තේය. ඔහු දැන් තම ව්‍යාපාරය පුළුල් කිරීමට සහ නව කාබනික නිෂ්පාදන හඳුන්වා දීමට සැලසුම් කරයි.

රසිඳුගේ ක්‍රියාවලියට අදාළව, 'ව්‍යාපාර ක්‍රියාකාරකමක්' බවට පත් වූ මොහොත කුමක්ද ?

1. ඔහු කාබනික එළවළු වගාවක් ආරම්භ කළ මොහොතේ සිට.
2. ඔහු අස්වනු නෙළා ගත් පසු අසල්වැසියන්ට සහ මිතුරන්ට නොමිලේ බෙදා දුන් මොහොතේ සිට
3. ඔහු තම නිෂ්පාදන සුපිරි වෙළඳසැලකට සහ දේශීය වෙළඳපොළකට නිතිපතා විකිණීමට පටන් ගත් මොහොතේ සිට
4. ඔහු තම ව්‍යාපාරය පුළුල් කිරීමට සහ නව නිෂ්පාදන හඳුන්වා දීමට සැලසුම් කළ මොහොතේ සිට
5. ඉහත කිසිවක් නැත.

4) ජාතික ආර්ථිකයට ව්‍යාපාරයක ඇති දායකත්වය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

i. ව්‍යාපාර නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මගින් විරැකියා අනුපාතය අඩු කිරීමට දායක වේ.
ii. ව්‍යාපාර බදු ගෙවීම මගින් රජයේ ආදායම් ඉහළ නංවන අතර, එමගින් පොදු සේවා සැපයීමට රජයට හැකි වේ.
iii. ව්‍යාපාර නව්‍යකරණය හා පර්යේෂණ සඳහා ආයෝජනය කිරීමෙන් තාක්ෂණික දියුණුවට මග සාදයි.
iv. ව්‍යාපාර අපනයන ප්‍රවර්ධනය කිරීමෙන් රටට විදේශ විනිමය ගෙන එන අතර, එමගින් ගෙවුම් ශේෂය වැඩිදියුණු වේ.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් වැදගත් දායකත්වය(න්) ලෙස සැලකිය හැක්කේ කුමන ප්‍රකාශය(න්) ද ?

1. i හා ii පමණි.
2. i, ii සහ iii පමණි.
3. ii, iii සහ iv පමණි.
4. i, iii සහ iv පමණි.
5. i, ii, iii, iv සියල්ල.

5) ව්‍යාපාරයක "අයිතිකරුවන්" සහ "ණය දෙන්නන්" යන පාර්ශ්වකරුවන් දෙදෙනාටම පොදු වන ප්‍රධාන අපේක්ෂාව කුමක් ද?

1. ව්‍යාපාරයේ දියුණුව පිළිබඳව අඛණ්ඩව දැනුම ලබා ගැනීම.
2. ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීම.
3. තමන් ආයෝජනය කළ හෝ ලබාදුන් මුදල් සුරක්ෂිතව නැවත ලබා ගැනීම.
4. සේවකයන්ට ප්‍රමාණවත් වැටුප් හා දීමනා ලබාදීම.
5. රජයට නිසි බදු ගෙවීම.

6) ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ආනයනික බදු ප්‍රතිපත්තිය ගෝලීය වෙළඳපොළට ඇති කළ ප්‍රධාන බලපෑම කුමක්ද ?

1. ගෝලීය වෙළඳාම තීව්‍ර වී රටවල් අතර ආර්ථික සහයෝගිතාවය වැඩි දියුණු වීම.
2. ඇමරිකානු නිෂ්පාදනවල මිල අඩුවීම නිසා ගෝලීය වෙළඳපොලේ ඇමරිකානු භාණ්ඩ සඳහා ඉල්ලුම වැඩිවීම.
3. ගෝලීය වෙළඳ යුද්ධයක් ඇතිවී, සැපයුම් දාම අඩාල වී, ජාත්‍යන්තර ආයෝජන අවිනිශ්චිතතාවයට පත්වීම.
5. සංවර්ධනය වෙමින් පවතින රටවලට ඇමරිකානු වෙළඳපොලට පහසුවෙන් ප්‍රවේශවීමට හැකිවීම.
5. ලෝක වෙළඳ සංවිධානයේ නීතිරීති තවත් ශක්තිමත් වීම.

7) අයිසැක්ගේ ව්‍යාපාරය විසින් නව නිර්මාණ පිළිබඳ සොයා බැලීම, පවතින නිෂ්පාදන වැඩිදියුණු කිරීම, අඩු පිරිවැය ක්‍රම සොයා ගැනීම ආදී කටයුතු පිළිබඳව වැඩි අවධානයකින් යුක්තව කටයුතු කරයි. එම කටයුතු ඇතුළත් වන ව්‍යාපාර කාර්යය කුමක් ද?

1. මෙහෙයුම් කටයුතු
2. අලෙවිකරණය කටයුතු
3. මූල්‍ය කටයුතු
4. පරිපාලන කටයුතු
5. පර්යේෂණ හා සංවර්ධන කටයුතු

8) ව්‍යාපාර සඳහා AI (කෘත්‍රිම බුද්ධිය) තාක්ෂණය භාවිතයෙන් ලැබෙන වාසි අතුරින් පහත දැක්වෙන්නේ වාසියක් නොවන්නේ කුමක් ද?

1. දත්ත විශ්ලේෂණය තුළින් තීරණ ගැනීම වැඩිදියුණු කිරීම
2. ස්වයංක්‍රීයකරණය හරහා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
3. ගනුදෙනුකරුවන්ට ඉක්මන් හා පුද්ගලිකකරණය කළ සේවාවක් ලබාදීම
4. ව්‍යාපාරික තීරණ ගැනීම සම්පූර්ණයෙන් මිනිසුන්ගෙන් ඉවත් කිරීම
5. මිනිස් දෝෂ අවම කිරීම

9) පහත සඳහන් සාධක යුගලයන්ගෙන් ව්‍යාපාරයක "ආසන්න පරිසරයට" සහ "බාහිර පරිසරයට" නිවැරදිව අනුපිළිවෙළින් අයත් වන සාධක යුගලය කුමක් ද?

1. සැපයුම්කරුවන්, දේශපාලන පරිසරය
2. කළමනාකරුවන්, තරගකරුවෝ
3. සේවකයන් ආර්ථික පරිසරය
4. සංවිධාන ව්‍යුහය, ගෝලීය පරිසරය
5. කළමනාකරුවන්, සමාජ හා සංස්කෘතික

10) ව්‍යාපාරයක් තම කාබන් පියසටහන අඩුකර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාවක් නොවන්නේ කුමක් ද?

1. බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා LED ආලෝකකරණය සහ නවීන උපකරණ භාවිතය.
2. සේවකයන්ට පොදු ප්‍රවාහනය, පාපැදි හෝ පයින් ගමන් කිරීමට දිරිගැන්වීම සහ වාහන භාවිතය අවම කිරීම
3. දේශීයව නිෂ්පාදිත අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන මිලදී ගැනීම වෙනුවට විදේශීය නිෂ්පාදන සඳහා මනාපය දැක්වීම.
4. අපද්‍රව්‍ය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය (recycling) කිරීම සහ නැවත භාවිතය (reusing) ප්‍රවර්ධනය කිරීම.
5. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් (සූර්ය බලය, සුළං බලය වැනි) භාවිතයට මාරු වීම.

11) කුඩා ව්‍යාපාරයක් ආරම්භ කළ ඉමේෂ්, තම ව්‍යාපාරය තිරසර (Sustainable) ලෙස පවත්වාගෙන යාමට ත්‍රී බොටම් ලයින් (Triple bottom Line) රාමුව යොදා ගැනීමට තීරණය කරයි. ඔහු ලාභය (Profit), මිනිසුන් (People), සහ ග්‍රහලෝකය (Planet) යන අංශ තුනම සමබර ලෙස සලකා බලයි. මෙම රාමුව යොදා ගැනීමෙන් ඉමේෂ්ට ලැබෙන ප්‍රධාන වාසිය කුමක් ද?

1. ඔහුගේ ව්‍යාපාරයේ ආර්ථික (Profit) , සමාජීය (People) සහ පාරිසරික (Planet) බලපෑම් තුලනාත්මකව තක්සේරු කර දිගුකාලීන තිරසරත්වය (Sustainability) තහවුරු කිරීම.
2. ඔහුගේ ව්‍යාපාරයේ ලාභය (Profit) ඉක්මනින් වැඩි කිරීමට පමණක් අවධානය යොමු කිරීම.
3. පාරිසරික (Planet) බලපෑම් අවම කිරීමට පමණක් උත්සාහ කිරීම.
4. සේවකයින්ගේ (People) වැටුප් වැඩිකිරීමට පමණක් ඉලක්ක කිරීම
5. වෙළඳපොළ තරගකාරීත්වය (Market competitiveness) වැඩිදියුණු කිරීමට පමණක් යොමු වීම

12) ලංකාවේ පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ වෙළඳපොළේ සාධාරණත්වය තහවුරු කිරීම සඳහා පිහිටුවා ඇති "පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය" (Consumer Affairs Authority - CAA) වෙත පැමිණිලි ඉදිරිපත් කිරීම හෝ තොරතුරු ලබාගැනීම සඳහා භාවිත කළ හැකි ක්ෂණික දුරකථන අංකය කුමක් ද?

1. 1977 2. 119 3. 110 4. 1999 5. 1919

13) ඍජු බද්දක් සහ වක්‍ර බද්දක් අතර ඇති මූලික වෙනස වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ කුමන ප්‍රකාශය ද?

1. ඍජු බදු පාරිභෝගිකයා මත පටවන අතර, වක්‍ර බදු ව්‍යාපාරය මත පටවයි.
2. ඍජු බදු ආදායම මත පදනම් වන අතර, වක්‍ර බදු භාණ්ඩ හා සේවා පරිභෝජනය මත පදනම් වේ.
3. ඍජු බදු ආර්ථික වර්ධනයට දායක වන අතර, වක්‍ර බදු ආදායම් විෂමතාව වැඩි කරයි.
4. ඍජු බදු පහසුවෙන් මාරු කළ හැකි අතර, වක්‍ර බදු මාරු කළ නොහැක.
5. ඍජු බදු රාජ්‍ය ආදායම අඩු කරන අතර, වක්‍ර බදු රාජ්‍ය ආදායම වැඩි කරයි.

14) රටක උද්ධමනය පාලනය කිරීම සඳහා, මහ බැංකුව විසින් භාවිත කළ හැකි මූල්‍ය ප්‍රතිපත්තියක් වන්නේ කුමක් ද?

1. රාජ්‍ය වියදම් වැඩි කිරීම
2. බදු අනුපාත අඩු කිරීම
3. පොලී අනුපාත ඉහළ දැමීම.
4. රාජ්‍ය ණය නිකුත් කිරීම
5. සහනාධාර ලබාදීම

15) පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

i. විරැකියා අනුපාතය අඩු කිරීම
ii. ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම.
iii. මිල ස්ථායිතාව පවත්වා ගැනීම.
iv. ආදායම් විෂමතාව අඩු කිරීම.

රජය විසින් ආර්ථිකයට මැදිහත් වීමේ ප්‍රධාන අරමුණු ලෙස ඉහත ප්‍රකාශ අතුරින් සැලකිය හැක්කේ කුමන ප්‍රකාශ ද?

1. i සහ ii පමණි.
2. i, ii සහ iii පමණි.
3. ii, iii සහ iv පමණි.
4. i, iii සහ iv පමණි.
5. i, ii, iii, iv සියල්ල.

16) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින්, "ඕනෑම සංවිධානයක" මූලික ලක්ෂණයක් ලෙස සැලකිය නොහැක්කේ කුමක් ද?

1. පොදු අරමුණක් තිබීම.
2. පුද්ගලයන් දෙදෙනකු හෝ වැඩි ගණනක් සිටීම.
3. කාර්යයන් සහ වගකීම් බෙදී තිබීම.
4. ලාභ ඉපැයීම ප්‍රධාන අරමුණ වීම.
5. නිශ්චිත ව්‍යුහයක් සහ ධූරාවලියක් තිබීම.

17) කේවල ස්වාමි ව්‍යාපාරයක දී, ව්‍යාපාරයෙන් උපයන ලාභ බෙදී යන්නේ කෙසේ ද?

1. එය හවුල්කරුවන් අතර සමානව බෙදී යයි.
2. එය ව්‍යාපාරයේ සියලුම සේවකයින් අතර බෙදී යයි.
3. ව්‍යාපාරයේ නමින් රජයට බදු ලෙස කොටසක් ගෙවා ඉතිරිය අයිතිකරුට හිමිවේ.
4. සියලුම ලාභ ව්‍යාපාරයේ තනි අයිතිකරුට හිමිවේ.
5. ලාභය බැංකු ගිණුමක තැන්පත් කර පසුව ආයෝජනය කරයි.

18) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් නිර්වචනය කරන්නේ "ලාභ ඉපැයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය'' ලෙසයි. මෙම නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක අත්‍යවශ්‍යම ලක්ෂණයක් ලෙස නොසැලකෙන කරුණ කුමක්ද?

1. ලාභ ලැබීමේ අරමුණක් තිබීම.
2. ව්‍යාපාර කටයුත්තක් පැවතීම.
3. පුද්ගලයින් සිටීම (අවම වශයෙන් දෙදෙනකු)
4. හවුල්කරුවන් අතර ලිඛිත ගිවිසුමක් තිබීම
5. අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (එකඟතාවයක්)

19) හවුල් ව්‍යාපාරයක හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවකදී හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියට අනුව අදාළ නොවන ප්‍රකාශය කුමක් ද?

1. හවුල්කරුවන්ට ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට දායක වීමට අයිතියක් ඇත.
2. යෙදූ ප්‍රාග්ධනය මත පොලී නොගෙවිය යුතු ය.
3. ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් විසින් පොළී ගෙවීම් දරන ලද වියදම් ව්‍යාපාරය විසින් නැවත ඔවුන්ට ගෙවිය යුතුය.
4. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා 5%ක වාර්ෂික පොලී හිමි වේ.
5. ලාභ ලාභ යෙදූ ප්‍රාග්ධනය අනුව බෙදා ගත යුතුය.

20) 2007 අංක 7 දරන සමාගම් පනතට අනුව සංස්ථාපනය කළ හැකි සමාගම් වර්ග අතර "කොටස් නිකුත් කිරීම" සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. සීමිත පෞද්ගලික සමාගම් සහ සීමිත පොදු සමාගම් අතර ඇති ප්‍රධාන වෙනස වනුයේ පොදු සමාගම්වලට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කළ හැකි වීමයි.
2. සීමාරහිත සමාගම්වලට කොටස් නිකුත් කළ නොහැකි ය.
3. ඇපයෙන් සීමිත සමාගම්වලට කොටස් නිකුත් කිරීම අනිවාර්ය වේ.
4. සීමිත පොදු සමාගම්වලට උපරිම කොටස්කරුවන් සංඛ්‍යාවක් ඇත.
5. ලැයිස්තුගත පොදු සමාගම්වලට කොටස් විකිණීමට අවසර නැත.

21) සමූපකාර ව්‍යාපාරයක මූලික මූලධර්මයක් ලෙස පහත දැක්වෙන කරුණු අතරින් වඩාත් වැදගත් වන්නේ කුමක් ද?

1. සාමාජිකත්වයේ විශාලත්වය මත පදනම් වූ ඡන්ද බලය
2. ලාභ උපරිම කිරීම ප්‍රධාන අරමුණ වීම.
3. එක් සාමාජිකයකුට එක් ඡන්දයක් (One Member, One Vote) යන මූලධර්මය මත පාලනය වීම.
4. රජයේ දැඩි පාලනය යටතේ ක්‍රියාත්මක වීම.
5. බාහිර ආයෝජකයින්ට පමණක් ලාභාංශ ගෙවීම.

22) රාජ්‍ය දෙපාර්තමේන්තුවක නීතිමය පුද්ගලභාවය කෙබඳු වේද?

1. රාජ්‍ය දෙපාර්තමේන්තුවට කළමනාකරණ මණ්ඩලයක් ලෙස ස්වාධීන නීතිමය පුද්ගලභාවයක් ඇත.
2. රාජ්‍ය දෙපාර්තමේන්තුව නීතිය ඉදිරියේ නියෝජනය වන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙන් ය.
3. රාජ්‍ය දෙපාර්තමේන්තුව නීතිමය කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නමින් පෙනී සිටිය යුතුය.
4. රාජ්‍ය දෙපාර්තමේන්තුවට වෙනම නීතිමය පුද්ගලභාවයක් නොමැති අතර, එහි සියලු කටයුතු අදාළ කාරක සභාවේ නමින් සිදු කෙරේ.
5. රාජ්‍ය දෙපාර්තමේන්තුවට එහිම වූ ස්වාධීන නීතිමය පුද්ගලභාවයක් ඇති අතර, එයට ''දෙපාර්තමේන්තුවේ නමින්'' නඩු පැවරිය හැක.

23) අභ්‍යන්තර ව්‍යවසායකත්වය (Intrapreneurship) යන්නට අදාළව, පහත දැක්වෙන ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

1. එය ලාභ උපරිම කිරීම අරමුණු කරගත්, බාහිර ආයෝජකයින් විසින් ආරම්භ කරන ව්‍යාපාරයකි.
2. එය පවතින සංවිධානයක් තුළ සේවකයකු විසින් නව අදහස් හා නිෂ්පාදන සංවර්ධනය කිරීමයි.
3. එය සමාජීය හා පාරිසරික ගැටලු විසඳීම අරමුණු කරගත් ව්‍යාපාරයකි.
4. එය රටවල් කිහිපයක ක්‍රියාත්මක වන ජාත්‍යන්තර වෙළඳාම කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපාරයකි.
5. එය කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් රැස් කිරීමයි.

24) පහත සඳහන් ප්‍රකාශ අතරින් ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර ඇති ප්‍රධාන වෙනස කුමක් ද?

1. ව්‍යවසායකයා නිරන්තරයෙන් තමන්ගේ ව්‍යාපාර කටයුතුවල නිරත වන අතර, ව්‍යාපාරිකයා ව්‍යවසායකත්ව ප්‍රවේශයකින් යුතුව කටයුතු කරයි.
2. ව්‍යවසායකයා අවදානම අවම කිරීමට කටයුතු කරන අතර, ව්‍යාපාරිකයා අවදානමට මුහුණ දෙයි.
3. ව්‍යවසායකයා සාම්ප්‍රදායිකයකු වන අතර, ව්‍යාපාරිකයා නවෝත්පාදකයෙකි.
4. ව්‍යවසායකයා නව අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹන අතර, ව්‍යාපාරිකයා පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි.
5. ව්‍යවසායකයා ව්‍යාපාරයට ගැටලු ඇති වූ විට ඒවාට මුහුණ දී විසඳුම් ලබාදෙන අතර ව්‍යාපාරිකයා එවිට ව්‍යාපාරයෙන් ඉවත් වේ.

25) පහත සඳහන් එක් එක් තාක්ෂණයට අදාළ නිවැරදි අර්ථ දැක්වීම තෝරන්න.

i. කෘත්‍රිම බුද්ධිය (AI)

ii. වලාකුළු පරිගණනය (Cloud Computing)

iii. බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology)

iv. අන්තර්ජාලයේ යුක්ත වස්තු (loT)

තාක්ෂණයන්හි අර්ථ දැක්වීම,

a. පරිගණක මිනිසුන් මෙන් සිතීමට, ඉගෙනීමට සහ ගැටලු විසඳීමට හැකියාව ලබාදීම.

c. ඔබේ පරිගණකයේ හෝ සේවාදායකයේ වෙනුවට අන්තර්ජාලයේ දත්ත ගබඩා කිරීමට සහ වැඩසටහන් ධාවනය කිරීම.

d. අන්තර්ජාලය හරහා දත්ත එකතු කර හුවමාරු කරන ස්මාර්ට් උපාංග.

e. ලේසියෙන් වෙනස්කළ නොහැකි, ආරක්ෂිත ඩිජිටල් ගනුදෙනු වාර්තාවක්.

ගැලපීම්,

1) i - a, ii - c, iii - e, iv -d  2) i - a, ii - d, iii - c, iv - e

3) i -c, ii - e, iii - a, iv- d  4) i - d, ii - a, iii - e, iv - c

5) i - e, ii - c, iii - d, iv - a

26) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මූලික වශයෙන් සලකා බැලිය යුතු වැදගත්ම කරුණ කුමක් ද?

1. විශාල සමාගම්වල තරගකාරිත්වය
2. ආරම්භක ප්‍රාග්ධනය සපයා ගැනීමේ හැකියාව
3. රජයේ සහන සහ නීති රීති
4. පාරිභෝගික අවශ්‍යතාවයක් හෝ වෙළඳපොළ අවස්ථාවක් හඳුනා ගැනීම.
5. නවීන තාක්ෂණය භාවිත කිරීමේ හැකියාව.

27) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා ලබාදෙන මූල්‍යමය හා මූල්‍යමය නොවන දිරිගැන්වීම් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශයන් සලකා බලන්න.

අ. දිගුකාලීන අඩු පොලී ණය යනු මූල්‍යමය දිරිගැන්වීමකි.
ආ. වෙළඳපොළ ප්‍රවේශය සහ අලෙවිකරණ සහාය යනු මූල්‍යමය නොවන දිරිගැන්වීම් වේ.
ඇ. තාක්ෂණික පුහුණුව සහ නවෝත්පාදන සහාය මූල්‍යමය දිරිගැන්වීම් ලෙස වර්ග කෙරේ.
ඈ. සෘජු ප්‍රදාන සහ සහනාධාර මූල්‍යමය නොවන දිරිගැන්වීම් වේ.

ඉහත ප්‍රකාශයන්ගෙන් සත්‍ය වන්නේ කුමන ප්‍රකාශ/ප්‍රකාශයන් ද?

1. අ සහ ඇ පමණි.
2. ආ සහ ඈ පමණි.
3. අ සහ ආ පමණි.
4. අ, ආ සහ ඇ පමණි.
5. සියල්ලම සත්‍ය වේ.

28) හොඳ මුදලක ප්‍රධාන ලක්ෂණය තෝරන්න.

1. කල්පවතින බව
2. සීමිත සැපයුම
3. පොදු පිළිගැනීම
4. කුඩා ඒකක වලට බෙදිය හැකි වීම
5. පහසුවෙන් හඳුනාගත හැකිවීම

29) පහත සඳහන් මූල්‍ය ආයතන සමූහයන් අතරින් "තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන'' නිවැරදිව නිරූපණය කරන්නේ,

1. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, ප්‍රාදේශීය සංවර්ධන බැංකු, සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති.
2. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල සමාගම්
3. බලපත්‍රලාභී මුදල් සමාගම්, සමූපකාර ග්‍රාමීය බැංකු, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, සේවක අර්ථසාධක අරමුදල
4. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල, රක්ෂණ සමාගම්
5. බලපත්‍රලාභී මුදල් සමාගම්, සමූපකාර ග්‍රාමීය බැංකු, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල සමාගම්, සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති.

30) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර ප්‍රධානතම වෙනස ලෙස සැලකිය හැක්කේ,

1. වාණිජ බැංකු විසින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ණය ලබාදීම
2. විශේෂිත බැංකු විසින් නිශ්චිත අංශ සඳහා පමණක් සේවා සැපයීම
3. වාණිජ බැංකු විසින් ජංගම ගිණුම් පවත්වාගෙන යාම
4. විශේෂිත බැංකු විසින් ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යාම
5. වාණිජ බැංකු විසින් විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම

- **31 සිට 50 දක්වා හිස්තැනට සුදුසු වචන යොදන්න.**

31. අ. තම අවශ්‍යතා සඳහා සිදුකෙරෙන නිෂ්පාදන කටයුත්ත …………………….. ලෙස හඳුන්වන අතර වෙළඳපොළ අරමුණු කරගත් නිෂ්පාදනය …………………….. ලෙස හැඳින්වේ.

 ආ. මිනිස් …………………….. හා …………………….. ප්‍රධාන ව්‍යාපාර කටයුතු දෙක ලෙස සැලකේ.

32. …………………….. නිෂ්පාදනය තුළින් …………………….. ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ …………………….. නිෂ්පාදිත බිහිවීම …………………….. පදනම විය.

33. භාණ්ඩ හා සේවා අන්තර්ජාලය ප්‍රමුඛ පරිගණක තාක්ෂණය ඔස්සේ මිලදී ගැනීම හා විකිණීම…………………….. ලෙස හඳුන්වන අතර සියලු ව්‍යාපාර කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම …………………….. ලෙස හඳුන්වයි.

34. අභ්‍යන්තර පරිසර සාධක අධ්‍යයනයෙන්…………………….. හා දුර්වලතා හඳුනාගන්නා අතර බාහිර පරිසරය සාධක විශ්ලේෂණයෙන් …………………….. හා…………………….. හඳුනාගනී.

35. ව්‍යාපාර කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග ලෙස…………………….., ……………………., …………………….. , ………………… පෙන්වාදිය හැක.

36. ව්‍යාපාර වෙත උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට උපරිම සාධාරණයක් වන ලෙස කටයුතු කිරීම ව්‍යාපාර …………………….. වන අතර ව්‍යාපාර සමග කටයුතු කරන සියලු පාර්ශ්වයන්ට යහපත් වන ලෙස …………………….. හා …………………….. පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම ව්‍යාපාර …………………….. ලෙස හඳුන්වයි.

37. ව්‍යාපාර වෙත සිදුකරන …………………….. බලපෑම් ……………………., …………………….. හා …………………….. ආයතන ලෙස මට්ටම් තුනකින් සිදු කරයි.

38. සමාගමේ…………………….. කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා …………………….. මෙන්ම කළමණාකරණය හා …………………….. පිළිබඳ කරුණු සමාගම් සංස්ථාපනය සඳහා ගම් රෙජිස්ට්‍රාර් වෙත යවන වැදගත්ම ලියවිල්ල …………………….. යි.

39. රජයේ …………………….. ප්‍රථම වතාවට අලෙවි කර මුදල් ලබාගන්නා වෙළඳපොළ …………………….. වෙළඳපොළ වන අතර මෙම වෙළඳපොලට සහභාගී වීමට …………………….. විසින් අවසර ලබා දී ඇති ආයතන …………………….. අලෙවිකරුවන් ලෙස හඳුන්වයි.

40. …………………….. අතරමැදියන් ලෙස …………………….., …………………….. හා …………………….. සලකනු ලැබේ.

41. ලාභ අරමුණින් පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා …………………….. , …………………….. , …………………….. හා …………………….. සියලු කටයුතු ව්‍යාපාර ලෙස සැලකේ.

42. වාණිජ බැංකු වල පවත්වාගෙන යන …………………….. ශේෂ ලෙස හඳුන්වන අතර මේවා …………………….. හරහා ගෙවීම් සිදු කරයි.

43. 100% ක ද්‍රවශීලතාවයක් නැතත්…………………….. , …………………….., කාර්යය ඉටුකරන පහසුවෙන් …………………….. බවට පත්කළ හැකි …………………….. ආසන්න මුදල් ලෙස සැලකේ.

44. ඒකක භාරයක් යනු ආයෝජකයන්ට …………………….. විකිණීමෙන් රැස්කර ගන්නා මුදල් වලින් සමන්විත …………………….. කි. මෙම අරමුදල වෘත්තීය අරමුදල් …………………….. විසින් …………………….. යොදවනු ලැබේ.

45. රජයේ ආර්ථික අරමුණු ළඟා කර ගැනීමට ව්‍යාපාර වලට දායක විය හැකි ආකාර 04 ක් ලියන්න.

01. ……………………………………………………………………………..
02. ……………………………………………………………………………..
03. ……………………………………………………………………………..
04. ……………………………………………………………………………..

46. පාරිභෝගික වගකීම් 04 ක් ලියන්න.

01. ……………………………………………………………………………..
02. ……………………………………………………………………………..
03. ……………………………………………………………………………..
04. ……………………………………………………………………………..

47. වර්තන වියදම් සඳහා නිදසුන් 02 ක් ලියන්න.

01. ……………………………………………………………………………..
02. ……………………………………………………………………………..

48. සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 04 ක් ලියන්න.

01. ……………………..……………………..………………………………………..

02. ……………………..……………………..………………………………………..

03. ……………………..……………………..………………………………………..

04. ……………………..……………………..………………………………………..

49.




a - ............................

b - ...........................

c - ............................

d - ...........................

50. පහත ප්‍රමිතීන්ට අදාළ පද්ධති සහතිකකරණය ලියන්න.

01. ISO 50001 :-……..……………………..………………………………………..

02. ISO 26000 - 2010 :-……………………..……………………..……………….…..

03. ISO 27001 - 2005 :-……………………..……………………..……………….…..

04. ISO 22000 - 2005 :-……………………..……………………..……………….…..